**සමූපකාර අතිරික්ත අරමුදල - 2016**

**-----------------------------------------------**

සමූපකාර අතිරික්ත අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමූපකාර අතිරික්ත අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1**

---

මූල්‍ය ප්‍රකාශන සමඟ ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

---

දේපළ පිරියත හා උපකරණ යටතේ ශුද්ධ අගය ශුන්‍ය වශයෙන් සටහන් කර ඇති පිරිවැය රු.1,840,569 ක් වූ පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර, ක්‍රියාකාරී භාවිතයෙන් බැහැර කිරීමට තබා ඇති සේ වර්ගීකරණය කළ ඒවාද යන්න මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වනවිට භාවිතයේ නොමැති පිරිවැය රු. 189,001 ක් වූ පරිගණක මෘදුකාංග ශේෂ පත්‍රයේ අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා පාරිභෝගික සංගමය වෙත ප්‍රදානය කළ ණය වෙනුවෙන් ඇපයට තැබූ ස්ථාවර තැන්පතුව අවලංගු කිරීමේදී 2014 ජනවාරි 01 දින සිට 2014 මාර්තු 06 දක්වා කාලපරිච්ඡේදයට අදාල පොලිය රු.207,296 ක් බැංකු ජංගම ගිණුමට බැර කර තිබුණද එය තවදුරටත් ලැබිය යුතු ශේෂයක් ලෙස 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සටහන් කර තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ ණය ගැතියෝ යටතේ දක්වා තිබුණු සමුපකාර සමිති ණය ශේෂයෙහි ලෙජරය හා උපලේඛනය සැසඳීමේදී රු.86,618,052 ක වෙනසක් පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දේපල පිරියත හා උපකරණවලට අදාල අගය සහ උපලේඛන අනුව වූ එම අගයෙහි රු.163,663 ක වෙනසක් පැවතුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන අගය සහ උපලේඛන අනුව එම අගයෙහි රු.131,104 ක වෙනසක් පැවතුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ සමුච්චිත අරමුදල් ගැලපීම වශයෙන් රු.6,257,342 ක් සටහන් කර තිබුණද එම ගැලපීම් මොනවාද යන්න පැහැදිලි නොකෙරුණි.

**2.2.4 අවිනිශ්චිත ගිණුම**

1997 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.9,475,735 ක බැර ශේෂයක් අවිනිශ්චිත ගිණුමක පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| i. | සමුපකාර සමිති සඳහා දෙන ලද ණය සහ පොලිය | 579,288,575 | ශේෂ සනාථ කිරීම් |
| ii. | සමුපකාර අරමුදලින් ලැබිය යුතු මුදල | 5,029,486 | |
| iii. | පොදු තැන්පත් ගිණුම | 7,444,158 | පොදු තැන්පත් ලේඛනය හා විස්තරාත්මක උපලේඛනය |
| iv. | ස්ථාවර තැන්පත් ඇප ණය | 58,918,112 | ණය ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් |
| v. | ඇවර ගිණුම | 2,620,473 | ඇවර ගිණුමේ පිටපතක් |
| vi. | ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල | 150,000 | ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උපලේඛන |
| vii. | ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | 3,871,256 | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගෙවිය යුතු ණය පොලී රු.81,871,370 ක් සහ අතිරික්ත අරමුදලට ගෙවිය යුතු රු.6,017,550 ක් වර්ෂ 04 ක සිටද, එකතුව රු.1,020,235 ක්වූ ගෙවිය යුතු වගකීම් ගිණුම් 05 ක් වසර 5 කට වැඩි කාලයක සිටද නිරවුල් නොවී තිබුණි.

(ආ) සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය වෙත 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලබාදී තිබූ රු.157,221,330 ක ණය මුදලින් රු.130,398,674 ක ණය ශේෂ හා ඊට අදාල රු.51,898,908 ක පොලියක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. මින් අවස්ථා 5 දී ලබාදී තිබූ රු.107,721,330 ක ණය මුදලින් කිසිදු ණය වාරික මුදලක් අය වී නොතිබුණි.

(ඇ) 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සමුපකාර සමිති 9 ක් වෙත ලබා දී තිබුණු එකතුව රු. 284,119,496 ක්වූ ණය මුදලින් 2016 දෙසැම්බර් 31 දක්වා කිසිඳු මුදලක් අය වී නොතිබුණු අතර ඊට අදාළව අයවිය යුතු පොලිය රු. 41,383,507 ක් විය.

(ඈ) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක සුපිරි කිරි වෙළඳසැලක් ඉදිකිරීම සඳහා සි/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය වෙත 2007 වර්ෂයේදී ලබා දී තිබුණු රු.18,249,750 ක ණය මුදලින් රු.16,549,750 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට අයවීමට තිබෙන නමුත් එම සංගමය දැනට අක්‍රීය තත්ත්වයේ පවතින බැවින් ණය අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

(ඉ) සී/ස නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතියට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් ඉටුකර ගැනීම සඳහා 2014 ජනවාරි 17 දින රු.4,000,000 ක පොලී රහිත ණය මුදලක් ලබාදී තිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මාස 03 කින් අවසන් කර ලැබෙන ආදායමින් හෝ සමුපකාර සමිතියට එකතු වන මුදල්වලින් යන දෙකෙන් පළමුව ලැබෙන මුදලින් එකවර ණය මුදල ගෙවා නිදහස් වන බවට ණය ගිවිසුම් ප්‍රකාරව එකඟතාව පලකර තිබුණද 2016 දෙසැම්බර් 31 දිනට රු.1,000,000 ක ණය ශේෂයක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

(ඊ) කොබෙයිගනේ සමුපකාර සමිතියට අයත් ඉන්ධනහලක් නවීකරණය සඳහා 2013 අප්‍රේල් 05 දින ලබා දී තිබුණු රු.10,000,000 ක ණය මුදල සහ එකතුව රු.2,613,932 ක්වූ පොලිය 2016 දෙසැම්බර් 31 දක්වා අයවී නොතිබුණි. 2014 ඔක්තෝබර් 10 දින නැවත එම කාර්යය සඳහා රු.7,000,000 ක ණය මුදලක් 2014 දෙසැම්බර් සිට රු.150,000 ක්වූ මාසික වාරික වශයෙන් අයකිරීමට ලබා දී තිබුණි. ඒ අනුව මෙම ණය මුදලට අදාලව 2016 දෙසැම්බර් 31 දින වනවිට රු.3,600,000 ක් අයවිය යුතු වුවද, අයවී පැවතියේ රු.1,104,510 ක් පමණි.

(උ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වර්තමානය වනවිට අක්‍රීය සමිති බවට හඳුනාගෙන ඇති සමුපකාර සමිති 12 ක් වෙත 1990 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුළ ලබා දී තිබු ණය මුදල් වලින් 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.22,354,358 ක ණය ශේෂයක් හා එකතුව රු.8,728,473 ක පොලී මුදලක් අයවීමට පැවතුනි

.

(ඌ) සී/ස නොච්චියාගම සහ සී/ස හොරොව්පතාන විවිධ සේවා සමුපකාර සමිතිය ඈවර කර ඇති බව අනාවරණය වී ඇති බැවින් මෙම සමිති දෙක සඳහා ලබා දී ඇති ණය මුදල් වලින් 2016 දෙසැම්බර් 31 දිනට අය විය යුතු පිළිවෙලින් රු.241,666 සහ රු.1,000,000 ක් වූ ණය ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුනි.

(එ) සමාලෝචිත වර්ෂය වනවිට අක්‍රීයව පැවති සී/ස කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතියට ලබා දී තිබුණු රු.14,408,121 ක ණය මුදලක් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණයගැතියන් යටතේ ඉදිරියට ගෙන එමින් පැවතුනි. සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් 2015 වර්ෂයේ කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට ලබා දුන් පිළිතුරෙහි"පාසල් සඳහා නොමිලේ කිරිහල් ලබාදීමේ වැඩසටහන යටතේ ලබාදුන් මෙම මුදල නැවත අයකර ගැනීම සිදුකළ නොහැකි බවත් ආධාර මුදලක් නිසා ගිවිසුම් ගත වීමක් සිදු වී නොමැති බවත් දක්වා තිබුණි.

(ඒ) 1999 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,716,566 ක අගරු චෙක්පත් ශේෂයක් පැවතුනි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 188 (2) | 2003 හා 2014 වර්ෂයන්ට අදාල එකතුව රු.106,093 ක්වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4: 3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ කාර්යසාධන වාර්තාව සමග සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.103,997,327 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.89,477,486 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,519,841 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමුපකාර සමිති පොළී ආදායම් රු.6,534,263 කින් අඩු වුවද, ස්ථාවර තැන්පතු පොළිය හා භාණ්ඩාගාර බිල්පත් පොළිය පිළිවෙලින් රු.17,931,767 කින් හා රු.4,005,058 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ මූල්‍ය අතිරික්තය අඩුවී තිබුණු අතර 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2012 වර්ෂයේ රු.90,258,873 ක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු.104,574,614 දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මගින් පළ කරන ලද සමූපකාර රීතීන්හි 44 වගන්තිය අනුව "අතිරික්ත අරමුදලෙහි" මුදල් පහත කාර්යයන් සඳහා යෙදවිය හැකි බව පෙන්නුම් කෙරුණි.

(අ) ඕනෑම ලියාපදිංචි කරන ලද ප්‍රාථමික සමිතියක කොටස් මිලට ගැනීමෙන් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කළ හැකි වෙනත් ආකාරයකට හෝ එවැනි සමිතියකට ආධාර කිරීම.

(ආ) අතිරික්තයක් ඇති වී තිබෙන දිස්ත්‍රික්කයේ පිහිටි ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියකට යම්කිසි ස්ථාවර වත්කම් මිලයට ගැනීමට ආධාර කිරීම.

(ඇ) ඇවරකරුවකුට විරුද්ධව ඇති සිවිල් නඩුවකදී ඔහුගේ නිදහසට ක්‍රියා කිරීමට ඔහුට ආධාර කිරීම.

(ඇ) සමුපකාර සමිති පනතේ 3 (1) (ඇ) හා (ඈ) වගන්තිය අනුව පිහිටුවන ලද ඕනෑම ලියාපදිංචි කළ සමිතිවලට ආධාර කිරීමේ කටයුත්ත සඳහා පිහිටුවන ලද වෙනත් ආයතනයකට හෝ ආධාර කිරීම.

ඉහත සඳහන් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ආධාර මුදලක් සමුපකාර සමිති වෙත ලබාදී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමුපකාර සමිති 106 වෙත රු.773,117,004 ක මුදලක් ණය වශයෙන් ලබා දී තිබුණද මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කටයුතු සිදු කිරීම දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.593,542,978 ක් හෙවත් ලබා දුන් ණය මුදලින් සියයට 77 ප්‍රමාණයක් සහ එකතුව රු.175,002,229 ක පොලි මුදලක් අයවීමට තිබුණි.

(ආ) මානව සම්පත් සමුපකාර සමිතිය ඈවර කිරීමේ කටයුතු වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විටින් විට පරිපාලන වියදම්, තීරක ගාස්තු, නීති වියදම්, ගමන් වියදම්, සංග්‍රහ, රැස්වීම්, විගණන කටයුතු සඳහා සහ තැන්පතු නිදහස් කිරීම සඳහා දරන ලද රු.56,901,825 ක්වූ ශේෂයේ නිවැරදිතාවය මානව සම්පත් සමුපකාර සමිතියෙන් තහවුරු කරවා ගැනීමක් සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙම සමිතියේ ඈවර කිරීමේ කටයුතු වෙනුවෙන් දරා තිබුණු රු.1,244,081 ක් අදාල සමිතියෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී බැංකු ජංගම ගිණුමේ රු.මිලියන 3 ඉක්මවූ ශේෂයක් සෑම මාසයකදීම පැවැති අතර අතිරික්ත මුදල් හඳුනාගෙන, එම මුදල් පොළී ආදායමක් ලැබෙන පරිදි ආයෝජනය කිරිමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

1972 අංක 5 දරන සමුපකාර පනතට අදාලව නිකුත් කර ඇති සමුපකාර සමිති රීති 44(iii) ප්‍රකාර සමුපකාර අතිරික්ත අරමුදලින් ණය ලබා දිය හැක්කේ සමුපකාර සමිතිවලට පමණක් වුවද ඊට පටහැනි ලෙස 2013 වර්ෂයේදි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත සියයට 16 පොලි අනුපාතය මත මාසික වාරික 06 කින් ගෙවා නිම කිරීමේ පදනම මත රු.75,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. ණය මුදල් ආපසු ගෙවීමේ මුල්‍යමය ශක්‍යතාවය පිලිබඳ නොසලකා මෙම ණය ලබා දී තිබුණු අතර 2016 දෙසැම්බර් 31 වන විට රු.62,091,327 ක ණය මුදලක් හා රු.15,893,123 ක පොලී මුදලක් අයවිය යුතුව පැවතුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4: 3 ඡේදය ප්‍රකාරව 2016 මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් සමුපකාර අතිරික්ත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුණේ 2017 අගෝස්තු 28 දිනදීය.

**6.** **පද්ධති හා පාලනයන්**

----------------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ජ'නල් සටහන් පිළියෙල නොකිරීම හා අනුමත නොකිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඇ) ණය පාලනය | (i) සමුපකාර සමිතිවල මූල්‍ය ශක්‍යතාවය පරීක්ෂා නොකිරීම.<br>(ii) ණය ලබා දීමේදි ගිවිසුම්වලට එළඹ නොතිබීම, ලබාදුන් ණය පිළිබඳ පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හා ණය අයකර ගැනීමේ දුර්වලතා පැවතීම. |